# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1715/6 – 2011 ජූලි 19 වැනි අඟහරුවාදා – 2011.07.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2011 අංක 139 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/3/2010/ඩබ්එස්/219.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: හක්/5/1/1/97.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2011 ජූලි මස 07 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, හක්මණ.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දබඩපත්තුව නැගෙනහිර සුළු කොට්ඨාසයේ, මුරුතමුරේ යන ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක එම්ආර්/එච්කේඑම්/2011/59 සහ 2011.03.24 දිනැති පුගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0723ක් පමණ වන තෙලඹුගහවත්තහේන නොහොත් පුහුකොස්ගහහේන *නොහොත්* අවරියාගහවත්ත නමැති ඉඩම් කොටසට මායිම්.

01. කැබලි අක්ෂර 'ඒ' – තෙලඹුගහවත්තහේන *නොහොත්* **පුහුකොස්ගහහේන *නොහොත්* අවරියාගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0723ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට සහ බටහිරට: මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

08 - 26

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2011 අංක 140 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2008/ඩබ්එස්/234.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: අඹ/කෝ/3/1/අත්/136.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2011 ජූලි මස 07 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, අඹගමුව කෝරළය.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹගමුව කෝරළේ සුළු කොට්ඨාසයේ, රම්පාදෙණිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක එන්යූ/ඒඑම්බී/2010/37 සහ 2011.01.07 දිනැති සංශෝධිත ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0075ක් පමණ වන කෙනිල්වර්ත් වත්ත නමැති ඉඩම් කොටස් දෙකට (2)ට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කෙනිල්වර්ත් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0063ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: කෙනිල්වර්ත් වත්ත; දකුණට සහ බටහිරට: කෙනිල්වර්ත් වත්ත, කැබලි අක්ෂර බී සහ කෙනිල්වර්ත් වත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – කෙනිල්වර්ත් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0012ක් පමණ**

උතුරට: කෙනිල්වර්ත් වත්ත, කැබලි අක්ෂර ඒ සහ කෙනිල්වර්ත් වත්ත; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ සහ කෙනිල්වර්ත් වත්ත; දකුණට: කෙනිල්වර්ත් වත්ත, මාර්ගය (මා.සං.අ.) සහ කෙනිල්වර්ත් වත්ත; බටහිරට: මාර්ගය (මා.සං.අ.) සහ කෙනිල්වර්ත් වත්ත.

08 - 27

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2006 ජූලි මස 27 වැනි දින අංක 1455/25 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වන අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2006 අංක 254 දරන ආඥාවෙන් මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2005/ඩබ්එස්/510.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 110/2/5/පොදු/104.
2011 ජූලි මස 13 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 80/5, ''ගොවිජන මන්දිරය'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

**උපලේඛනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙයාල දහමුන පත්තුව සුළු කොට්ඨාසයේ හිරිවඩුන්න ගමේ පිහිටි කෑගල්ල දිස්ත්‍රික් මැනුම් අධිකාරී විසින් 2006.05.04 දිනැතිව පිළියෙල කරන ලද අංක මු.පි.කෑ. 3230 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0020ක් පමණ වූ බොරැල්ලේහේන *නොහොත්* සියඹලාගහහේන නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බටහිරට: බොරැල්ලේහේන *නොහොත්* සියඹලාගහහේන.

08 – 28

---

ශුද්ධි පත්‍රිකාවයි

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2011 අංක 52 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2008/එම්වී/408.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 11/3/3/1/14.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයට යටත්ව 2011.04.06 දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* අංක 1700/12 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* මා විසින් පළ කළ 2011 අංක 52 දරන ආඥාවේ ඉඩමේ විස්තරයේ සඳහන් ඉඩම් කොටස් 132ට පහත නම්වලින්, ප්‍රමාණයන්ගෙන් හා මායිම්වලින් යුක්ත ඉඩම් කොටස් 5 ද ආදේශ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

128. **කැබලි අක්ෂර 'ඩීඉසඩ්' – කරඹවැල්පිටිය – ප්‍රමාණය: හෙක්. 3.3035ක් පමණ**

උතුරට: රජය හිමිකම් කියන මකුල්මඩ කැලය; නැගෙනහිරට: කැබලි අක්ෂර ඩීවයි සහ රජය හිමිකම් කියන මකුල්මඩ කැලය; දකුණට සහ බටහිරට: රජය හිමිකම් කියන මකුල්මඩ කැලය.

129. **කැබලි අක්ෂර 'ඊඒ' – මකුල්මඩ – ප්‍රමාණය: හෙක්. 3.4602ක් පමණ**

උතුරට: රජය හිමිකම් කියන මකුල්මඩ කැලය; නැගෙනහිරට: රජය හිමිකම් කියන මකුල්මඩ කැලය සහ කැබලි අක්ෂර ඊබී; දකුණට: කැබලි අක්ෂර ඊබී සහ කුඹුක්ගොල්ලේ ඇළ; බටහිරට: කුඹුක්ගොල්ලේ ඇළ සහ රජය හිමිකම් කියන මකුල්මඩ කැලය.

130. **කැබලි අක්ෂර 'ඊබී' – මකුල්මඩ – ප්‍රමාණය: හෙක්. 3.7386ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඊඒ සහ රජය හිමිකම් කියන මකුල්මඩ කැලය; නැගෙනහිරට: කැබලි අක්ෂර ඊසී; දකුණට: කුඹුක්ගොල්ලේ ඇළ; බටහිරට: කුඹුක්ගොල්ලේ ඇළ සහ කැබලි අක්ෂර ඊඒ.

131. **කැබලි අක්ෂර 'ඊසී' – මකුල්මඩ – ප්‍රමාණය: හෙක්. 3.4359ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඊබී සහ රජය හිමිකම් කියන මකුල්මඩ කැලය; නැගෙනහිරට: රජය හිමිකම් කියන මකුල්මඩ කැලය සහ කැබලි අක්ෂර ඊඩී; දකුණට: කුඹුක්ගොල්ලේ ඇළ; බටහිරට: කැබලි අක්ෂර ඊබී.

132. **කැබලි අක්ෂර 'ඊඩී' – මකුල්මඩ – ප්‍රමාණය: හෙක්. 3.5153ක් පමණ**

උතුරට, නැගෙනහිරට සහ දකුණට: රජය හිමිකම් කියන මකුල්මඩ කැලය; බටහිරට: රජය හිමිකම් කියන මකුල්මඩ කැලය, කුඹුක්ගොල්ලේ ඇළ සහ කැබලි අක්ෂර ඊසී.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: එල්ඩී/05/2008/එම්වී/408.
2011 ජූලි මස 07 වැනි දින,
'ගොවිජන මන්දිරය', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 29

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.